# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව- ECON –E2015

සූක්ෂම ආර්ථික විද්‍යාව

<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය :පැය 03 යි

---

01. අ) "ආර්ථික කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් පූර්ණ තරඟකාරී වෙළඳපල ඒකාධිකාරී වෙළඳපලට වඩා කාර්යක්ෂමය" පැහැදිළි කරන්න.

ආ) පූර්ණ තරඟකාරී වෙළඳපල අසාර්ථකවීමට බාහිරතා බලපාන්නේ කෙසේද?

02. පහත සඳහන් මාතෘකා හතරකට (04) සටහන් ලියන්න.

අ) මිල නායකත්ව ආකෘතිය

ආ) කාටල සංවිධාන

ඇ) මිල සහ ආදායම් පරිභෝජන වක්‍ර

ඈ) ප්‍රත්‍යක්ෂ වරණ න්‍යාය

ඉ) ඒන්ජල් වක්‍රය

03. අ) උපේක්ෂා වක්‍ර න්‍යායට අනුව ඉල්ලුම් වක්‍රයක් ගොඩනගන්නේ කෙසේද?.

ආ) මිල ප්‍රතිවිපාකයක ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක රූප සටහන් මගින් පැහැදිළි කරන්න.

04. අ) "බදු කුලිය අතිරික්තයකි " "බදු කුලිය පිරිවැයකි "මෙම ප්‍රකාශයන් එකිනෙකට පරස්පර විරෝධී ද? හේතු දක්වන්න.

ආ) "ඕනෑම නිෂ්පාදන සාධකයකට ආර්ථික බදුකුලියක් ඉපැයිය හැකිය" විමසන්න.

05. අ) " ප්‍රසාරණ මාර්ගය පිහිටනුයේ වැටි රේඛා ප්‍රදේශය තුළය." පැහැදිළි කරන්න.

ආ) සම නිෂ්පාදන වක්‍ර සිතියම උපයෝගී කරගනිමින් පරිමාණානුකූලඵල න්‍යාය පැහැදිළි කරන්න.

06. අ) ඒකාධිකාරී තරඟ වෙළඳපොල තත්ත්වය සහ පූර්ණ තරඟකාරී වෙළඳපල තත්ත්වය අතර සැසඳීමක් කරන්න.

ආ) "සැබෑ ලොව ව්‍යාපාරික ආයතනවල මූලික අරමුණ ලාභ උපරිම කිරීම නොවේ." සාකච්ඡා කරන්න.

07. ඒකාධිකාරී කර්මාන්තයක මුළු පිරිවැය ශ්‍රිතය පහතින් දැක්වේ.

**TC= 200+ 100Q**

මෙම පිරිවැය දරා නිපදවන භාණ්ඩය X සහ Y යන වෙළඳ පොලවල් දෙක සඳහා බෙදා හැර මිල විශේෂණය කරන අතර, එම වෙළඳපලවල් දෙකේ ඉල්ලුම් සමීකරණ පහත සඳහන් වෙයි.

$P_X = 260 - 4Q_X$

$P_Y = 140 - 6Q_Y$

අ) වෙළඳපලවල් දෙක සඳහා බෙදාහරින භාණ්ඩ ප්‍රමාණයන්, වෙළඳපලවල් දෙකෙහි භාණ්ඩ අලෙවි කරන මිල ගණන්, වෙළඳපලවල් දෙකේ මිල ඉල්ලුම් නම්‍යතාවන් , සහ කර්මාන්තය ලබන මුළු ලාභය ගණනය කරන්න.

ආ) ඉහත පිරිවැය සහ ඉල්ලුම් තත්ත්වයට මුහුණ දෙන පූර්ණ තරඟකාරී කර්මාන්තයක සමතුලිත මිල, සමතුලිත ප්‍රමාණය සහ කර්මාන්තය ලබන ලාභය ගණනය කරන්න.

08. අ) ස්ථිතික සහ ගතික ආර්ථිකවිද්‍යාව අතර වෙනස පැහැදිළි කරන්න.

ආ) මකුළු දැල් න්‍යාය විස්තර කර එහි වැදගත්කම සාකච්ඡා කරන්න.

****************************